---

## ඉමදූව ප්‍රාදේශීය සභාව
## ගාල්ල දිස්ත්‍රික්කය

---

### 01. මූල්‍ය ප්‍රකාශන

### 1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2012 මාර්තු 30 දින ද, ඉකුත් වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2011 මාර්තු 30 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2012 ඔක්තෝබර් 30 දින සභාවේ සභාපතිවරයා වෙත යවන ලදි.

### 1.2 මතය

මාගේ පරීක්ෂණයේ පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව ඉමදූව ප්‍රාදේශීය සභාවේ 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම් හැර 2011 දෙසැම්බර් 31 දිනට ඉමදූව ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරීත්වය පිලිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදු පිළිගත් ගිණුම්කරණ මුලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඉදිරිපත් කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

### 1.3 මූල්‍ය ප්‍රකාශන පිලිබඳ අදහස් දැක්වීම

#### 1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

වත්කම් හා බැරකම් බෙදාදීමේ කමිටුවේ නිර්දේශය මත හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් ඉමදූව ප්‍රාදෙශීය සභාවට පැවරිය යුතු ලෙසට තීරණය කර තිබූ රු.9,794,393 ක වත්කම් හා රු.2,051,704 ක බැරකම් පාදක කරගෙන ගිණුම් පිළියෙල කර තිබුණ ද, 2012 ජූනි 27 දින වනවිටත් අදාල වත්කම් හා බැරකම් නීත්‍යානුකූලව ප්‍රාදේශීය සභාව වෙත පවරාගෙන / පවරා දී නොතිබුණි.

#### 1.3.2 විගණනය සඳහා සාක්ෂි නොවීම

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොකිරීම නිසා එකතුව රු.23,729,131 ක් වූ ගනුදෙනු විගණනයේ දී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

## 02. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන අනුව, 2011 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ප්‍රාදේශීය සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.319,637 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.1,607,017ක් විය.

### 2.2 ආදායම් පරිපාලනය

#### 2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම්

සභාපතිවරයා විසින් සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| | ආදායම් විෂයය | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|---|
| | | රු.000' | රු.000' | රු.000' |
| (i) | වරිපනම් හා බදු | 421 | 200 | 175 |
| (ii) | බදු කුලී | 1,050 | 1,073 | - |
| (iii) | බලපත්‍ර ගාසතු | 502 | 737 | 142 |
| (iv) | වෙනත් ආදායම් | 25,222 | 13,728 | 27,034 |

#### 2.2.2 උසාවි දඩ හා මුද්දර ගාස්තු

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2011 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතුව තිබූ මුදල් පහත දැක්වේ.

| | | රු. |
|---|---|---|
| (i) | උසාවි දඩ | 226,373 |
| (ii) | මුද්දර ගාස්තු | 5,948,416 |

### 2.3 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත භෞතික සම්පත්

රු.126,000 ක් වටිනාකම වූ මිනි කුබෝටා ට්‍රැක්ටරය වසර 04 ක කාලයක් කෝදාගොඩ උප කාර්යාල භූමියෙහි දිරාපත් වෙමින් පැවතුණි. එමෙන්ම ට්‍රැක්ටරය අලුත්වැඩියා කිරීමට හෝ අපහරණය කිරීමට සභාව කටයුතු කර නොතිබුණි.

---

## 2.4 ආර්ථික නොවූ ගනුදෙනු

ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට දීමනා ගෙවීම සම්බන්ධව නිකුත් කර ඇති 2005 ඔක්තෝබර් 05 දිනැති අංක:1413/15 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාද ජනරජයේ (අතිවිශේෂ) ගැසට් නිවේදනයේ සඳහන් කරුණුවලට පටහැනිවමාසික සභා රැස්වීම් 05 කට සහභාගී නොවූ මන්ත්‍රීවරුන් 10 දෙනෙකුට රු.54,500 ක දීමනාවක් ගෙවා තිබුණි.

## 2.5 කොන්ත්‍රාත් පරිපාලනය

### ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ ප්‍රමාදයන්

ආදාහනාගාරය ඉදිකිරීම සඳහා රු.6,661,623 ක මුදලක් හා ඉමදූව වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා රු.22,156,680 ක මුදලකට කොන්ත්‍රාත්කරුවන් දෙදෙනෙකු සමග පිළිවෙලින් 2007 අගෝස්තු 08 දින හා 2007 දෙසැම්බර් 12 දින ගිවිසුම් අත්සන් කර, වැඩ ආරම්භ කර තිබ අතර, ගිවිසුම් අනුව 2008 පෙබරවාරි 09 දින හා 2008 සැප්තැම්බර් 12 දින වැඩ අවසන් කළ යුතුව තිබුණි. එහෙත් විගණන දිනය වූ 2012 ජුනි 27 දින දක්වා මෙම කර්මාන්තයන්හි වැඩ අවසන් කර නොතිබුණි. ප්‍රමාද කාලය පිළිවෙලින් වසර 03 මාස 11 ක් සහ වසර 04 මාස 06 ක් විය.

## 2.6 සංයුක්ත සැලැස්ම හා ක්‍රියාකාර සැලැස්ම

2003 ජුනි 02 දිනැති අංක: PED/12 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 05 ඡේදය ප්‍රකාරව සභාවේ දර්ශනය හා මෙහෙවර ඉටුකර ගැනීම සඳහා වර්ෂ 3 කට නොඅඩු කාලයක් සඳහා සංයුක්ත සැලැස්මක් හා වාර්ෂික ක්‍රියාකාර සැලැස්මක් සකස් කර නොතිබුණි.

## 2.7 අභ්‍යන්තර විගණනය

ආයතනය තුළ ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබූ අතර විගණන හා කළමනාකරණ කමිටු ද පිහිටුවා නොතිබුණි.

## 03. පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) ආදායම් පරිපාලනය
(ඇ) වත්කම් කළමනාකරණය

(ඈ) තොග පාලනය

(ඉ) කොන්ත්‍රාත් පරිපාලනය